# සරුබිම

හොරණ ශ්‍රීපාලියේ එස්. එම්. සිරිසේන මහතාගෙනි

දෙස, බස ගැන නිතර සිතමු
වැඩ කෙරුමට පෙරට ම යමු
උදලු, නගුල් අතට ගනිමු
රට සරුකර වවමු වවමු

රුපු නෙඩි මැඩ පා තද තෙද
නැංවූ හෙළ'ඹර හෙළ දද

හෙළ විරුවන් දිනුව බිමයි
අපට මෙතැන අයිති තමයි
නම ඇසුමද මිහිරි තමයි
මෙලක් පොළොව පරම රමයි

සිංහල බත කෑ දරුවන්
කවදත් එඩිතර විරුවන්

පිටරට වල මහ යුද වැද
බල බිඳද හිස් සිඳ බිඳ
දස දෙස පැතුරු සිහ නඳ
හෙළ දරුවන් ගැන මත කද

දෙස එළිකළ පා නොවිකුම්
සිහිකර ගාමිණී පැරකුම්

යලිත් මෙබිම වගා කරමු
මැලිකම දුරලා පිබිදෙමු
දෙස, රුස ඉහළට නංවමු
පෙරටම යමු පෙරටම යමු!